www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2hour

## Buddhism– I

## බුද්ධ ධර්මය– I

Name :- ................................................ Grade : -................ Index number:-....................

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වී වදාළේ,
   (1) වෙසක් පොහොය දා ය (2) නවම් පොහෝ දාය
   (3) ඇසල පොහෝ දාය (4) පොසොන් පොහෝ දාය

2. බුදුරජාණන් වහන්සේ සත් සතිය තුළ පස්වන සතිය ගත කළේ,
   (1) මිදෙල්ල ගස මුල ය (2) අජපල් නුගරුක මුල ය
   (3) කිරිපලු රුක මුල ය (4) ජය ශ්‍රී මහා බෝධි මූලයේදී ය

3. බුදුන් වහන්සේ තෙවන සතිය ගත කළේ,
   (1) සමවත් සුවයෙන් ය
   (2) අනිමිස ලෝචන පූජාව ප්‍රදර්ශනය කරමිනි
   (3) රුවන් සක්මන් කරමින් ය
   (4) ආනාපානසති භාවනාව මෙනෙහි කරමින් ය

4. ප්‍රථම ධර්ම දේශනාව හෙවත් දම්සක් පැවතුම් සූත්‍රය දේශනාව සිදු කළේ,
   (1) පොසොන් පොහොය දිනකදී ය (2) ඇසල පොහොය දිනකදී ය
   (3) නවම් පොහොය දිනකදී ය (4) වෙසක් පොහොය දිනකදී ය

5. ''රජතුමනි. මට පැවිදිවීමට අවසර දෙන්නෙම් මම ඒ දේ ඉටුකරමි.'' යන ප්‍රකාශ කලේ,
   (1) කාළුදායී ඇමතිවරයා ය (2) ඡන්න ඇමතිවරයා ය
   (3) සේනක ඇමතියා ය (4) මහානාම ඇමතියා ය

6. ඔබේ ශාස්තෘවරයා කවරෙක් ද? ඔබ රුචි කරන ධර්මය කුමක් ද? යැයි විමසන ලද්දේ,
   (1) තපස්සු භල්ලුක ය (2) භද්‍ද වග්ගිය කුමාරවරු ය
   (3) උපක ආජීවක ය (4) සංජය පිරිවැජියා ය



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

7. බුදුන් වහන්සේට ''වේළුවනාරාමය'' පූජා කරන ලද්දේ,
   (1) බිම්බිසාර රජතුමා ය (2) අශෝක රජතුමා ය
   (3) අජාසත් රජතුමා ය (4) වළගම්බා රජතුමා ය

8. ලංකාවේ බුදුන් වහන්සේගේ ''කේශ ධාතු'' නිදන්කර සෑද වූ චෛත්‍ය කුමක් ද?
   (1) ථූපාරාමය (2) මහියංගණ චෛත්‍ය
   (3) රුවන් වැලි මහාසෑය (4) මිරිස වැටිය දා ගැබ

9. ගිලානෝපස්ථානයේ වැදගත්කම පෙන්වීමේදී උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංගයකි,
   (1) ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් කටයුතු නොකිරීම
   (2) රෝගියාට විවිධ ඖෂධ වර්ග ලබා දීම
   (3) රෝගියාගේ සියලු ඉල්ලීම් ඉටු කිරීම
   (4) රෝගියාට නිරන්තර උපදෙස් ලබා දීම

10. සිය ස්වාමියා ද, දරුවන් දෙදෙනා ද, අහිමි වීමේ ශෝකයෙන් උමතු භාවයට පත්ව සිටි ඇයට බුදුන් වහන්සේ පිහිට වූහ. එසේ පිහිට වූ කාන්තාව වන්නේ,
   (1) කිසා ගෝතමී ය (2) පටාචාර ය
   (3) රජ්ජු මාලාය (4) විශාඛා ය

11. බුදුන් වහන්සේ දමනය කල නොහැකි සියල්ල දමනය කිරීමේ හැකියාවකින් යුක්ත වූ නිසා,
   (1) සුගත වන සේක (2) ලෝකවිඳු වන සේක
   (3) පුරිසධම්මසාරථී වන සේක (4) භගවා නම් වන සේක

12. නිවසේදී අනුගමනය කල යුතු හොඳ චාරිත්‍රයකි,
   (1) තමා භාවිතා කල ඇඳුම්- පැළඳුම් ඒ ඒ තැන නොදමා නිසි තැන්වල තැබීම
   (2) දවසට තුන්වරක් ආහාර- පාන ගැනීම
   (3) නිතර- නිතර තේ පානය කිරීම
   (4) මුළු දවස පුරාම පොත්පත් කියවීම

13. පාසලේ දී අනුගමනය කල යුතු සිරිතකි,
   (1) හුනස්නෙන් නැගිට ගුරු භවතුන්ට ආචාර කිරීම
   (2) පාවිච්චි කල ජලයේ බඳුන් ජලය ඉතිරි නොකිරීම
   (3) උදේ- හවස තේරුවන් වැඳීම
   (4) දෙගුරුන් වැඳ නිවසින් පිටවීම



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

14. නිවන් පතන මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංගයකි,
    (1) සිත තුළ ලෞකික සිතුවිලි පෝෂණය කර ගැනීම
    (2) පංච ඉන්ද්‍රියයන් පිනවීම
    (3) ලද දෙයින් සතුටු වීම
    (4) නිතර- නිතර ආමිස පූජාවන්හි නිරත වීම

15. බුදුන් වහන්සේගෙන් ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනය කළේ,
    (1) සහම්පති මහා බ්‍රහ්මයා ය
    (2) උපක ආජීවකයා ය
    (3) බිම්බිසාර රජතුමා ය
    (4) සොත්ථිය බමුණා ය

16. පස්වග මහණුන්ට රහත් වීමට බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍රය කුමක් ද?
    (1) දම්සක් පැවතුම් සූත්‍රය (2) අනත්ත ලක්ඛණ සූත්‍රය
    (3) සච්ච විභංග සූත්‍රය (4) මහා මංගළ සූත්‍රය

17. බුදුන් වහන්සේ විසින් මානය නැතිකොට පැවිද්ද ලබා දුන් ජටිලයා හැඳින්වූයේ,
    (1) උරුවේල කාශ්‍යප නමිනි (2) නදී කාශ්‍යප නමිනි
    (3) ගයා කාශ්‍යප නමිනි (4) උපක ආජීවක නමිනි

18. පෙර භවයකදී කල අකුසලයක් හේතුවෙන් දරුණු කුෂ්ඨ රෝගයකට ගොදුරු වූ හිමි නමකි.
    (1) ධර්මාරාම හිමි (2) පූතිගත්ත තිස්ස හිමි
    (3) ආනන්ද හිමි (4) මුගලන් හිමි

19. ප්‍රථම භික්ෂු හැට නම අමතා ධර්ම චාරිකාවේ වඩින ලෙස අනුශාසනා කල පොහොය දිනය වූයේ,
    (1) ඉල් පුර පසළොස්වක පොහොය දින ය
    (2) දුරුතු පුර පසළොස්වක පොහොය දින ය
    (3) ඇසළ පුර පසළොස්වක පොහොය දින ය
    (4) වෙසක් පුර පසළොස්වක පොහොය දින ය

20. බුදු සසුනේ අග්‍ර දායකයා යන නමින් ප්‍රචලිත වූ සිටුවරයා වූයේ කවුද?
    (1) සුමන සිටුවරයා (2) අනේපිඬු සිටුවරයා
    (3) සුදත්ත සිටුවරයා (4) බරණැස් සිටුතුමා

(20 x 2 = 40)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

## Buddhism – II

## බුද්ධ ධර්මය– II

Name :- ..................................................... Grade : -................ Index number:-....................

<u>**II කොටස**</u>

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5ට පිළිතුරු ලියන්න.**

1.

1. වෙසක් පොහෝ දින සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න.
2. සත් සතියෙන් හත්වන සතිය වැඩි සිටි ස්ථානය හා සිදුවූ වැදගත් සිදුවීම කුමක් ද?
3. ඉසිපතනාරාමය පිහිටා තිබුණේ කවර ප්‍රදේශයක ද?
4. පස්වග මහණුන්ගෙන් දෙනමක් නම් කරන්න.
5. යස කුල පුත් පැවදි වීමේ ආරංචිය අසා, ඔහුගේ හොඳම මිතුරන් ද පැමිණ බණ අසා, පැවදි වූහ, ඔවුන්ගෙන් දෙදෙනෙක් නම් කරන්න.
6. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.
7. නව අරහාදී බුදුගුණ වලින් දෙකක් ලියන්න.
8. සිරිත් - විරිත් යන වචනවල තේරුම ලියන්න.
9. කරණීය මෙත්ත සූත්‍රයට අනුව නිවන් පතන මෙත් වඩන්නකු තුල තිබිය යුතු ගුණාංග වලින් දෙකක් ලියන්න.
10. මෛත්‍රී භාවනාව ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ආනිශංස දෙකක් ලියන්න.

(2 x 10 =20)

2. (i) පඨමං තේධි පල්ලංකං ගාථාව සම්පූර්ණ කරන්න.
   (ii) බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ 5ක් ලියන්න. (ල.10)

3. (i) ප්‍රථම රහත් හැට නම් ලියා දක්වන්න.
   (ii) බිම්බිසාර රජතුමාගේ ශාසනික සේවය ගැන වාක්‍ය 05ක් ලියන්න. (ල.10)

4. (i) උපස්ථායකයකු සතු විය යුතු ගුණාංග 05ක් ලියන්න.
   (ii) පූතිගත්ත තිස්ස තෙරුන්ට බුදුන් වන්සේ පිහිට වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.10)

5. (i) රහසත් පව් නොකොට....... කවිය සම්පූර්ණ කරන්න.
   (ii) නව අරහාදී බුදුගුණ වලින් 5ක් ලියන්න. (ල.10)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. (i) සිරිත්- විරිත්වලට අදාළව පාසලේදී ප්‍රදර්ශනය කළ හැකි ආදර්ශ පාඨ 5ක් සකසන්න.
   (ii) පාසලේදී ඔබ විසින් අනුගමනය කල යුතු යහපත් සිරිත් 5ක් ලියන්න. (ල.10)

7. (i) කරණීය මෙත්ත සූත්‍රයට අනුව අරුත් ගන්වා ඇති සත්ත්වයන් 5ක් නම් කරන්න.
   (ii) මෛත්‍රී භාවනාව වඩන ආකාරය අනුපිළිවෙළින් ලියන්න.

(ල.10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk